වෙරුගල් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020මැයි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩනවාර්තාව 2020 අගෝස්තු 12දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වෙරුගල් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩුනිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මධ්‍යම රජය රු.5,266,800ක් වැයකර ප්‍රාදේශීය සභාව සඳහා කාර්යාල නිලධාරී වාසස්ථාන ඉදිකර 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට භාරදී තිබූ නමුත් මේ දක්වා මෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | රජයේ නිලධාරි වාසස්ථානවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල රු.5,266,800ක් වටිනා නිලධාරී වාසස්ථාන ඊළඟ වර්ෂයේ පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවල නියමිත ගිණුමට එකතු කරනු ලබන බව දන්වා සිටිමි. |

#### (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(i) ලැබිය යුතු ගිණුම්** | | |
| විවිධ පුද්ගලයින්ගෙන් ලැබි යුතු කඩකාමර හිඟ කුලී, පානීය ජලය බෙදාහැරීමේ ගාස්තු සහ යන්ත්‍ර හිඟකුලී ආදිය මගින් එකතුව රු.538,278 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාළ රු.538,278 ක හිඟහිටි පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නොමැත. එනමුත් මේ සම්බන්ධයෙන් තොරතුරු රැස්කර අයකිරීමට කටයුතු කරනු ලැබීම හෝ නැතහොත් සුදුසු ඒවා ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කරන බව දන්වමි. |

(ii) **ගෙවිය යුතු මුදල් ගිණුම්**

| | | |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ පුරනැගුම වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද කාර්යයන් සහ 2017 වර්ෂයේ PSDG, CBG සහ සභා අරමුදලින් සිදුකළ කාර්යයන්වලින් රඳවා ගනු ලැබූ පිළිවෙලින් රු.3,507,716ක් සහ රු.560,048ක් නියමිත කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවීමට හෝ ඒවා ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල ඇප මුදලින් 2020 වර්ෂයේ රු.44,013 ගෙවා නිරවුල් කර ඇත. ඉතිරි ඇප මුදල් සම්බන්ධයෙන් මෙම වර්ෂයේ නියමිත ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. |

(ඇ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.64,462,017 ක් වූ ගිණුම් විෂයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අවශ්‍ය ලේඛන පවත්වාගෙන යාමට හා අවශ්‍ය ඇමුණුම් මූල්‍ය ප්‍රකාශනවල ඇමිණීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. තවද, ඉඩම් හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා වාහන, පානීය ජල සම්බන්ධතා ආදිය සඳහා විස්තරාත්මක ලැයිස්තු ඊළඟ මූල්‍ය වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි අමුණනු ලැබේ. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය | සභාවේ මූල්‍ය, ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂණික සේවා, පාරිසරික සහ පොදු පහසුකම් වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර උපදෙස් ලබාගත යුතුය. එසේ වුවත්,සභාව | අවශ්‍ය කමිටු ස්ථාපිත කිරිමට පියවර ගත යුතු වීම. | උපදෙස්කමිටුසම්බන්ධයෙන් සභාව සමග සාකච්ඡා කර තීරණය කර නව ස්ථාවර කමිටු හතරක් ස්ථාපිත කරනු ලබන බව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා මෙම කමිටු ස්ථාපිත කර නොතිබුණි. | | |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය x වගන්තිය 193 | වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරුඅයවැය සැලැස්ම සමග සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සැසඳීම් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | වර්ෂය සඳහා තථ්‍ය ආදායම් පිළිබඳව අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා ඇමුණුම් ඊළඟ මූල්‍ය වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 මුදල් රෙගුලාසිය | වර්ෂ 2 කට වැඩි, රු.485,499 ක් වූ ලංසු තැන්පතු, විවිධ ඇප තැන්පතු සහ අනෙකුත් තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාල එකතුව රු.485,499 ක් වටිනා තැන්පතු සහ ඇප මුදල් සම්බන්ධයෙන් මෙම වර්ෂයේ සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ පරිපාලන චක්‍රලේඛයේ අංක 09/2009 දරන 02(iv) වගන්තිය | සභාවේ ලේකම්වරයා විසින් පැමිණීම සහ පිටවීම වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු නොකර නිවාඩු දිනයන්හි සභාවේ රාජකාරි කළ බවට සඳහන් කරමින් රු.67,993ක්නිවාඩු දින දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්තමානයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින්පැමිණීම සහ පිටවීම සටහන් තහවුරු කර අතිරේක වේලාව සඳහා දීමනා ගෙවීම සිදු කරනු ලැබේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,738,646ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,344,198 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 2,070 | 1,592 | 1,736 | 491 | 1,684 | 922 | 1,253 | 505 |
| වෙනත් ආදායම් | 962 | 385 | 385 | 266 | 3,990 | 1,849 | 2,863 | 256 |
| එකතුව | 3,032 | 1,977 | 2,121 | 757 | 5,674 | 2,771 | 4,116 | 761 |

### 2.2.2 කඩකාමර කුලීයට ලබාදීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සහා කඩ පේළියේ අංක D දරන කඩය වර්ෂ 05ක ගිවිසුම් යටතේ 2018 පෙබරවාරි 01 දින සිට කුලියට ලබා දී තිබුණි. එනමුත්, බදුකරු ගිවිසුම් ඔහුගේ නොහැකියාව හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී ගිවිසුම් අත්හිටුවා තිබුණි. මේ අනුව හිඟ කුලී රු.79,200 ක් සහ දඩ ගාස්තු රු.7,920 ක් වශයෙන් බදුකරුගෙන් අයකර නොමැති අතර ඔහු විසින් තැන්පත් කළ රු.144,000 ක් වූ ආරක්ෂිත ඇප මුදල ආදායමට මාරු කර නොතිබුණි. | හිඟ කුලී ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල බදුකරුගෙන් ලැබිය යුතු රු.79,200 ක් සහ දඩ ගාස්තු රු.7,920 ක් ආදිය ඔහුගේ තැන්පත් මුදල රු.144,000න් ගැලපීමටත් ඉතිරි මුදල නියමිත ක්‍රියාමාර්ග ගෙන ආදායමට මැරු කරනු ලබන බව දන්වා සිටිමි. එසේම ලංසු කැඳවා නව බදුකරුවන්ට ලබාදිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 2.2.3 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා ලැබිය යුතු වූ මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකර ගැනීම සඳහා නිසි පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු ආදායම් කඩිනමින් ගණනය කර අයකර ගත යුතුවේ. | 2017, 2018 සහ 2019 ආදි වර්ෂ සඳහා ලැබිය යුතු වූ මුද්දර ගාස්තු ගණනය කර ලබාගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලිපි මගින් ඉල්ලීම් සිදුකර ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

**තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සකස් කර නොතිබුණි. | පනතේ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව අවධානය යොමුකර ඇත. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රු.89,848ක් ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා 2017 ඔක්තෝබර් 02 දින ලබාදුන් නමුත් මෙම අරමුදල් අදාල අරමුණ සඳහා උපයෝජනය නොකර සභාවේ තැන්පත් ගිණුමේ රඳවා තිබීම නිරීක්ෂණය විය. | වැඩසටහනෙහි අරමුණ ළඟා කරගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා ලබාදුන් රු.89,848ක් මෙම වර්ෂයේ අදාල අරමුණ වෙනුවෙන් හෝ එයට සම්බන්ධිත සෞඛ්‍ය සේවාවන් සඳහා උපයෝජනය කරනු ලබන බව දන්වා සිටිමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේඅනුමත පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පැවැති නමුත් වර්ෂ 02කට අධික කාලයක සිට පුස්තකාලයාධිපතිවරයෙකු පත්කර ගෙන නොතිබුණි. | බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුස්තකාලයාධිපතිවරයෙකු පත් කරන ලෙසට ඒවනවිටත් දැනුම් දි තිබුණි. එනමුත්, නැවතත් ලිඛිතව දන්වා අදාල බඳවා ගැනීම් සිදු කිරීමේදි ඉල්ලීම් කර ලබාගනු ලබන බව දන්වා සිටිමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**(අ) පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙනත් ආයතන විසින් පරිත්‍යාග කරනු ලැබූ වාහන 15ක අයිතිය වර්ෂ 08 ක අධික කාලයක සිට සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ නමට පවරා නොගත් වාහන 08ක අයිතිය සම්බන්ධයෙන් මෙම වර්ෂයේ කටයුතු කරනු ලැබේ. |

**(ආ) නිෂ්කාර්ය වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සභාවට අයත් විවෘත වෙළෙඳ පොළ ගොඩනැගිලි 02ක් සහ කඩකාමර සංකීර්ණයකින් සමන්විත රු.2,272,800 ක් වටිනා කඩ කාමර පේළියක් 2011 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් සහ ICE කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල උපයෝජනය නොකර නිෂ්කාරයව පැවතිණි. | දේපළ නිසි අයුරින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙළෙඳ පොළ ගොඩනැගිල්ල සහ ICE කර්මාන්ත ශාලාව ආදිය ප්‍රතිසංස්කරණය කිරිම පිළිබඳවසාකච්ඡා කරමින් පවති. |
| (ii) | වාහන 10ක් වර්ෂ 04 කට අධික කාලයක සිට අලුත්වැඩියා නොකර අක්‍රීයව පැවති අතර ඒවා සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනිමටත් අලුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කිරීමත් කඩිනම් කළ යුතු වේ. | මෙම වාහන සම්බන්ධයෙන් අරමුදල් ලැබූ වහාම අලුත්වැඩියා කරනු ලැබේ. |
| (iii) | 2018 සහ 2019 කාල පරිච්ඡේදයේ රු.384,200කට මිලදී ගත් කසළ එකතු කිරිමේ බඳුන් 121 කින් බඳුන් 83ක් විගණන දිනය වන 2020 ජුනි 10 දින වන විටත් ගබඩා කාමරයේ තිබුණි. | සුදුසු ප්‍රතිලාභීන්ට බෙදාහැරීමට කටයුතු කළ යුතුවේ. | අදාල කසල එකතු කිරිමේ බඳුන්සුදුසු ප්‍රතිලාභීන්ට බෙදාහැරීමට කටයුතු නියමිත ක්‍රියාමාර්ග ගෙන තිබේ. |

(ඇ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 සහ 2019 වර්ෂවල සිදු කළ භාණ්ඩ සමීක්ෂණයේදී වර්ග 04ක භාණ්ඩ 127 ක ඌනතාවයක් පැවතිණි. | ඌනතාවයක් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2018 සහ 2019 වර්ෂවල සිදු කළ භාණ්ඩ සමීක්ෂණය අනුව හිඟ භාණ්ඩ පිළිබඳව මෙම වර්ෂයේදි ඉදිරි කටයුතු කරනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත් කර තිබූ නමුත්, අභ්‍යයන්තර විගණන කටයුතු 2020 ජූනි 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. අනුව අභ්‍යන්තර විගණක පත්කර තිබූ නමුත්, අරමුණ සාක්ෂාත් කරගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණනයේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් පසුව අභ්‍යන්තර විගණනය පිළිබඳව අනාවරණය කළ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණු බව දන්වා සිටිමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේසභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා තිබුණත්, කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කිසිදු ප්‍රගතියක් සිදුවී නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කිරීමටකටයුතු කළ යුතු වීම. | කළමනාකරණ කමිටු රැස්වීමේ සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදි ප්‍රගතිය පරිශීලනය කර නිර්දේශ ක්‍රියාත්මක කරනු ලබන බව දන්වා සිටිමි. |